## සුභසාධක සංගමය

01. බෞද්ධ පාසලක් වශයෙන් මලියදේව විද්‍යාලය ලාංකේය ජන සමාජය ස්පර්ශ කර ඇත. එබැවින් බෞද්ධ කටයුතු වලට අප ප්‍රමුඛ ස්ථානය ලබා දිය යුතුය. සුභ සාධක සංගමයේ ප්‍රථම කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම ගරුතර මහා සංඝරත්නය ප්‍රමුඛ කර ගනිමින් ආගමික වතාවත් ඉටු කිරීමෙන් අනතුරුව ආරම්භ කිරීම.






02. 2018 සුභසාධක අනුකම්ටුව සහ සුභසාධක සංගමය ඒකාබද්ධව පවත්වන්නට යෙදුනු බක්මහ උළෙල. ආදි ශිෂ්‍යයින්ගේ සුභ සාධනය සහ විද්‍යාලයේ අභිවෘද්ධිය වෙනුවෙන් සුභසාධක සංගමය කටයුතු කරමින් සිටී. ඉතා කාර්යබහුල ජීවන රටාවෙන් මිදී පවුලේ සියළු දෙනා සඳහාම සහභාගි විය හැකි අවුරුදු උළෙලක් ඉතා සාර්ථකව නිමා කෙරිනි. සාමාජිකයින් 100 දෙනෙකු පමණ ඉක්මවා පැමිණීම ඉතා වැදගත් කරුණක් මෙන්ම පැමිණි සැමට ත්‍යාගයක් පිරිනැමීමට කටයුතු යොදා තිබුණි. විවිධ වැඩසටහන් අතරේ සුහදතාවය වර්ධනය කර ගැනීම මෙන්ම දශක කිහිපයක සාමාජිකයන් අත්වැල් බැඳගත් අපූරු අවස්ථාවක් විය.














03. වාර්ෂික ක්‍රිකට් තරඟය මලියදෙව් පුතුන්ට අමතක නොවන අත්දැකීම් එකතු කරයි. එහි දී නරඹන්නන්ට අවශ්‍ය වූ හිස්වැසුම් අළෙවි කිරීම සඳහා දායකත්වය දැක්වීම සුහසාධක සංගමය කටයුතු කල අතර එහි ආදායම මලියදේව ආදි ශිෂ්‍ය සංගමයට බැරවේ.





04. ක්‍රීඩා උත්සවය සඳහාද අවශ්‍ය හිස්වැසුම් අළෙවියේ වගකීම ඉටු කිරීමට සුහසාධක සංගමය කටයුතු සළසා තිබුණි. ආදායම මලියදේව ආදි ශිස්‍ය සංගමයට සෘජුවම බැර වේ.










05. සුහසාධක සංගමයේ පරම්පරා කිහිපයක සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ඉහළ තලයකට ගෙන ඒම අරමුණු කර ගනිමින් සුහ සාධක සංගමයේ වාර්ෂික කමිටු සුහද හමුව සංවිධානය විය. විද්‍යාලයේ දියුණුව උදෙසා ඔවුන්ගේ සහයෝගය ඉතා වැදගත්ය.




06. ආදි ශිෂ්‍යයින්ගේ 04 දෙනෙකුගේ අභාවය සඳහා රු. 60,000/- ක මුදලක් ලබා දීම සහ සහභාගිත්වය (මල්වඩම් සහ බැනර්)








07. අසනීප තත්වයේ පසුවූ ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරී සාමාජික මහතකුගේ සුවදුක් බැලීම සඳහා ඔහුගේ නිවසට යාම - අවශ්‍ය ද්‍රව්‍යමය පරිත්‍යාගයන්ද සිදු කෙරිනි.